# දෙමව්පියන්ට සැලකීම දෙව් ලොවට මග පාදයි

## දේවදූත වර්ගය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 1 - පිටු අංක 244 - 245)

යම් පුතෙක් විසින් සිය ගෙදර දී දෙමව්පියන් පුදනු ලබත් ද ඒ කුලයෝ (පවුල්) බ්‍රහ්මයා සහිත වෙති.

යම් පුතෙක් විසින් දෙමාපියන් දෙදෙනා සිය ගෙදර දී පුදනු ලබත් ද එම කුලයෝ ප්‍රථම ආචාර්ය සහිත වෙති.

යම් පුතෙක් විසින් දෙමාපියන් දෙදෙනා සිය ගෙදර දී පුදනු ලබත් ද එම කුලයෝ ආහුණෙයා‍ය (පූජාවට යෝග්‍ය) සහිත වෙති.

බ්‍රහ්ම යනු මව්පියන්ට නමකි. ප්‍රථම ආචාර්ය යනු මව්පියන්ට නමකි. ආහුණෙයා‍ය යනු මව්පියන්ට නමකි. ඊට හේතු කවරේ ද යත්, මව්පියන් පුත්‍රයන්ට බොහෝ උපකාර ඇත්තෝ වෙති. අත් පා වඩා පෝෂණය කරන්නෝ වෙති. මේ ලෝකය දක්වන්නෝ වෙති.

මව්පියන් බ්‍රහ්ම යැයි ද, ප්‍රථම ආචාර්ය යැයි ද, ආහුණෙයා‍ය යැයි ද කියනු ලැබෙයි. ඔවුහු තම පුත්‍රයන් ට අනුකම්පා කරති. නුවණැත්තෝ මෙලොව දී මව්පියන්ට සලකන පුතුට ප්‍රශංසා කරති.

ඒ මව්පියන්ට සලකන පුතු පරලොව දී දෙව්ලොවට පැමිණ එහි දී ද සතුටු වෙයි.